පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 488

ආයතනයේ නම : මහා භාරකාර දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 488

நிறுவனத்தின் பெயர் : பொது நம்பிக்கைப் பொறுப்பாளர் திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 488

Name of the institution: Department Of Public Trustee

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

| | කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබාදෙන ලද නියෝග | අඩුපාඩු නිවැරදි කිරීමට කමිටු විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/ නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01. | <u>පරිගණක දත්ත පද්ධතියක් සකස් කිරීම වෙනුවෙන් රු.මිලියන 35 ක ප්‍රතිපාදන 2024 අයවැයෙන් ලබා දී ඇති බැවින් එහි වර්තමානතත්ත්වය</u><br><br>පරිගණක දත්ත පද්ධතියක් නොමැති වීම හේතුවෙන් මහා භාරකාර දෙපාර්තමේන්තුව සතු වත්කම් සම්බන්ධව තොරතුරු ලබා ගැනීමේ දී ගැටළුකාරී තත්ත්වයක් පවතින බව කාරක සභාව පෙන්වා දුන්නේය.<br><br>අදාළ ප්‍රතිපාදනය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 5 ක දත්ත පද්ධතීන් සකස් කිරීම සඳහා ලද ප්‍රතිපාදනයක් බවත්, දැනට එම කටයුත්ත සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර ඇති බවත්, අදාල ආයතනයන්හි අවශ්‍යතාවයන් හඳුනා ගැනීමෙන් පසු ඉදිරි සති කිහිපය තුළ මිල ගණන් කැඳවීම් සිදු කරනු ලබන බවත් බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) ප්‍රකාශ කළේය.<br><br>එමෙන්ම දැනට දෙපාර්තමේන්තුවට අයත් දේපළ ඇතුළත් ලේඛනයක් සකස් කර ඇති බවත්, නිලධාරීන් දෙදෙනෙකු යොදවා දිවයින පුරාවිසිරිපවතිනදෙපාර්තමේන්තුව සතු දේපළ පරිගණකගත කිරීම සිදු කරනු ලබන බව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. | බුද්ධ ශාසන ,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය යටතේ පවතින තවත් ආයතන වල මෘදුකාංග සංවර්ධන කාර්ය සඳහා රු.මිලියන 35 ක එකතු කල ප්‍රතිපාදනයක් 2024 වර්ෂයේදී වෙන් කර ඇත. එහෙත් පරිගණක මෘදුකාංග සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම නොමැතිකම සම්බන්ධයෙන් පැන නැගුන ගැටලු හේතුවෙන් එවකට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙතින් (ICTA) තාක්ෂණික උපදේශන සේවා හා සංවර්ධන සහය ලබා ගැනීමට අමාත්‍යංශ මගින් ඉල්ලීමක් ඉදිරිපත්කර ඇත.නමුත් එම ආයතනයේ එවකට පැවති කාර්ය බහුලත්ව සහ උපරිම ධාරිතාවයකින් පවරන ලද කාර්යන්හි නිලධාරින් යෙදවී ඇති බැවින් එම අවස්ථාවේදි අවශ්‍ය සහය ලබා දීමට අපහසු බව දන්වා ඇත. මේ අනුව පද්ධති අවශ්‍යතා තාක්ෂණික වශයෙන් හඳුනා ගැනීම හා සංවර්ධන කාර්යන් සිදු කිරීම සම්බන්ධයෙන් ගැටළු පැන නැගීම හේතුවෙන් මෙම කාර්ය අසාර්ථක වී ඇත. |

| | | |
|---|---|---|
| | | මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් මේ වන විට පවත්වාගෙන යනු ලබන SAP පරිගණක මෘදුකාංගයේ අවශ්‍යතා වැඩිදියුණු කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ තොරතුරුතාක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදේශණ සේවා ලබා ගනිමින් සිටී.උපදෙස් අනුව අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලබන අතර මූලික වශයෙන් එම පද්ධතිය දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ප්‍රමාණවත් වේ.<br><br>දෙපාර්තමේන්තුවට අයත් දේපල ලේඛනගත කිරීම මේ වන විට සිදුකරමින් පවතින අතර, සුදුසු පරිදි පරිගණකගත කිරීම ද සමගාමීව කරගෙන යනු ලබයි. |
| 02. | <u>මහා භාරකාර දෙපාර්තමේන්තුවේ දිවයින පුරා විසිරී ඇති දේපළ පරිපාලනය කිරීම</u><br><br>නව බඳවා ගැනීම් සිදු කිරීමට කාලයක් ගතවන බැවින් ගරු අමාත්‍යතුමා සමඟ ද සාකච්ඡා කොට නීතිපති උපදෙස් ද ලබා ගෙන ආඥා පනත සංශෝධනය කර හෝ දිසා අධිකරණ වලින් අදාළ අවසරය ලබාගෙන මහා භාරකාර තැන වෙත පවරා ඇති මුදල්/ දේපළ පරිපාලනය ප්‍රාදේශීය වශයෙන් සිදු කිරීම සඳහා දිස්ත්‍රික්ක 25හි ම දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම්වරුන් සම්බන්ධ කර ගනිමින් සුදුසු යාන්ත්‍රණයක් කඩිනමින් සකස් කරන ලෙස බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා (ප්‍ර.ග.නි.) / ගණන් දීමේනිලධාරියා (ග.නි.) වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. | 2024.05.08 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ලබාදුන් නිර්දේශ අනුව, මෙ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා හා අමාත්‍යාංශ ලේකම්තුමා සමඟ සාකච්ඡා කරන ලදී. එහිදී, මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත දේපල පවරනු ලබන පුද්ගලයන් එම දේපල මහා භාරකාර තැන වෙතට පවරන බැවිනුත්, මෙ සම්බන්ධයෙන් මහා භාරකාර ආඥා පනත හා භාර ආඥා පනත අනුව කටයුතු කලයුතු බැවිනුත් යන කරුණු සලකා බැලීමේදී, එලෙස දේපල/මුදල් දිස්ත්‍රික් ලේකම්වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් භාරයට පැවරීම නෛතික නොවන බව පෙනී යන ලදී. |

| | | |
|---|---|---|
| | | කෙසේ වෙතත්, මහා භාරකාර තැන වෙත පවරා ඇති මුදල්/දේපල පරිපාලනයේදී නෛතික කරුණු තහවුරු කරගැනීමේදී හා හිමිකාරිත්වය සම්බන්ධයෙන් හෝ වෙනත් නෛතික කරුණු සම්බන්ධයෙන් විශේෂයෙන් කටයුතු කල යුතු අවස්ථා වලදී දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරිගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 03. | <u>දෙපාර්තමේන්තුව වෙත දේපළ ලැබීම</u><br><br>අන්තිම කැමති පත්‍ර හා අධිකරණ නියෝග මගින් දෙපාර්තමේන්තුව වෙත දේපළ ලැබීම සිදු වන බව ප්‍රකාශ කළ බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රොබේට් බලපත්‍ර, අද්මිනිස්ත්‍රාත් බලපත්‍ර හා ආරක්ෂිත භාරකරුවෙක් ලෙස පත් කරමින් අධිකරණය මගින් මහාභාරකාර දෙපාර්තමේන්තුව වෙත දේපළ ලබාදීම සිදුවන බව සඳහන් කළේය. මේ සඳහා ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශීය ලේකම් වැනි පාර්ශ්වයන් සම්බන්ධීකරණයෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා කටයුතු කරන බව හෙතෙම වැඩිදුරටත් කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. | මහා භාරකාර තැන වෙත පවරා ඇති මුදල්/දේපල පරිපාලනයේදී නෛතික කරුණු තහවුරු කරගැනීමේදී හා හිමිකාරිත්වය සම්බන්ධයෙන් හෝ වෙනත් නෛතික කරුණු සම්බන්ධයෙන් විශේෂයෙන් කටයුතු කල යුතු අවස්ථා වලදී දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරිගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 04. | <u>මහා භාරකාර තැන වෙත පවරා ඇති දේපළ / වත්කම් වර්ග හා එම වර්ග යටතේ ලංකාව පුරා තිබෙන දේපළවල නිශ්චිත ප්‍රමාණ</u><br><br>මහා භාරකාර තැන වෙත වත්කම් ලැබෙන විවිධ මාර්ග කවරේ ද යන්න සහ එම එක් එක් වත්කම ලැබුණේ කවදාද, පවරනු ලැබුවේ කවුරුන් විසින් ද, පැවරීමට අදාළ කොන්දේසි කවරේද ආදී කරුණු ඇතුළත් ලේඛනයක් සකස් කරන ලෙසත්, ඉහතතොරතුරු ද ඇතුළත්ව මහා | මේ පිළිබඳ වාර්තාවක් අංක PT/02/CA/01/740 හා 2025.03.27 දිනැති ලිපිය මගින් ඔබ වෙත යොමු කර ඇත. |

| | | |
|---|---|---|
| | භාරකාර දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන එක් එක් සේවාවන් හා එම සේවාවන් යටතේ පසුගිය වසර 5 තුළ සිදුකර තිබෙන කාර්යභාරය පිළිබඳව 2024 ජුනි මස 20 දින කැඳවීමට නියමිත මීළඟ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී පරිගණක දෘෂ්‍ය ඉදිරිපත් කිරීමක් (Computer Presentation) සිදු කරන ලෙසත් බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කරන ලදී. | |
| 05 | <u>මහා භාරකාරතැන වෙත පවරා ඇති ඉඩම්/ දේපළ බදුදීම.</u><br><br>බදු දීමට අමතරව යුධ හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුව ආදී ආයතන සමඟ සාකච්ඡා කර සෙබළුන් හා සිරකරුවන් යොදවා මෙම ඉඩම් වඩාත් ඵලදායි වගා කටයුතු හා වෙනත් කර්තව්‍යයන් සඳහා යෙදවීම වැනි විකල්ප ක්‍රම පිළිබඳව ද කාරක සභාව පෙන්වා දෙන ලදී. | මහා භාරකාර වෙත පවරා ඇති ඉඩම් / වතු මහා භාරකාර දෙපාර්තමේන්තුව මඟින් කළමනාකරණය කිරීම හෝ මිල ගණන් කැඳවා බදු පදනම මත ලබා දීම සිදු කරනු ලබයි.<br>යෝජනා වූ පරිදි යුධ හමුදාව,සිවිල් ආරක්ෂක බලකාය හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ මෙම ඉඩම් / වතු වගා කිරීම පියවර ගනිමින් සිටියද එය ඵලදායී නොවුනි. ඒ අනුව බදු පදනම මත ලබාදීම සඳහා කටයුතු සිදු කරමින් සිටී. |
| 06 | <u>භාරයන්ගේ මුදල්</u><br><br>මහා භාරකාර දෙපාර්තමේන්තුව සතුව භාර 1130ක් පවතින අතර ඒ අතරින් භාර 1100ක් සක්‍රීය තත්ත්වයේ පවතින බව බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘති කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. මෙම භාරයන්ගේ මුදල්, ප්‍රධාන බැංකු 3 ක ගිණුම් 1936ක තැන්පත් කර ඇති අතර ඒවායේ රු.මිලියන 2,823 ක මුදලක් පවතින බව බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. සඳහන් කළේය. | භාරයන්හි අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී බැංකු මඟින් තරගකාරී මිල ගණන් ලබාගෙන ඉහළම පොලී අනුපාතයක් ඉදිරිපත් කරන බැංකුවේ ආයෝජනය කිරීමට කටයුතු කරනු ලබයි. |

| | | |
|---|---|---|
| | මෙම මුදල් අඩු පොලි අනුපාත යටතේ තැන්පත් කර ඇති බව විගණනයේදී පෙන්වා දී ඇති අතර අනතුරුව රාජ්‍ය බැංකු සමඟ සාකච්ඡා කර වාසිදායක පොලි අනුපාතික යටතේ තැන්පත් කිරීම මගින් 2023 වර්ෂය සඳහා රු.මිලියන 252 ක ආදායමක් උත්පාදනය කර ඇති බවත් එම මුදල් අදාළ භාරයන්හි අරමුණු ඉෂ්ඨ කිරීම සඳහා යොදවන බවත් බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළ අතර ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ලෙස ද අදාළ මුදල් ආයෝජනය කර ඇති බවත් වැඩි දුරටත් ප්‍රකාශ කළේය. | |
| 07 | <u>භාර වලින් ලද වාහන</u><br><br>එක් භාරයකින් ලද වාහනයක් දෙපාර්තමේන්තුව සතුව පවතින බවත් එය එම භාරයේ අපේක්ෂාව අනුව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා යොදාගෙන ඇති බවත් බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය. | මෙම වාහනය මේ වන විට දෛනික කටයුතු සඳහා භාවිතා නොකරයි.ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. |
| 08 | <u>ගාල්ල බද්දේගම සුදුවැලිපොතපිහිටි හැරී හපුගොඩ බුදලයේ වර්තමාන තත්ත්වය.</u><br><br>බදු දීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් සිදු කරන ලෙස කාරක සභාව විසින් උපදෙස් ලබා දුනි. | මෙම භාරය යටතේ පවතින ඉඩම් අක්කර 17 කින් යුතු මත්තකවත්ත මේ වනවිට ටෙන්ඩර් කර ඉහළම ලංසුවට බදු පදනම මත ලබා දී ඇත. අක්කර 61 පර්චස් 33 යුතු කැබලි 08 ක් බදු පදනම මත ලබාදීමට මේ වනවිට ටෙන්ඩර් කැඳවා ඇත. ඉතිරි ඉඩම් සම්බන්ධයෙන් අධ්‍යයනය කර සුදුසු පරිදි ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| 09 | <u>භාරයන්ගේ අර්ථලාභීන්</u><br><br>භාරයන්ගේ පැවරුම්කරුවන්ගේ අන්තිම කැමැත්ත පරිදි කටයුතු ඉෂ්ට කොට ඉතිරියක් තිබේ නම් මහා භාරකාරවරයාගේ අනුමැතිය පරිදි පුණ්‍ය කටයුතු සිදු කිරීම සඳහා අවසර ලබාදී ඇති බවත්, භාර රාශියක අඛණ්ඩ අර්ථලාභීන් ලෙස පුණ්‍ය ආයතන රාශියක් පවතින බවට කාරක සභාව වෙත කරුණු ඉදිරිපත් කෙරිණි. එම භාරයන්ගෙන් මුදල් ලැබීම පිළිබඳව අදාළ පුණ්‍ය ආයතන දැනුවත් කළ බවත්, මෙම දේපළ පැවරුම්කරුවන්ට පුණ්‍යානුමෝදනා කිරීමේ පුණ්‍ය කම ද දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන බවත් බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. | අදාල ආගමික චාරිත්‍ර අනුව පුණ්‍ය කටයුතු සිදු කිරීම එක් එක් භාරයේ ගිවිසුම ප්‍රකාරව නියමිත පරිද සිදු කරනු ලැබේ. |
| 10 | <u>විදේශ වන්දි උරුමකරුවන් වෙතලබාදීම.</u><br><br>විදේශගත වූ ශ්‍රී ලාංකිකයෙක් මිය ගිය විටදී එම පුද්ගලයා වෙනුවෙන් වූ වන්දි මුදල් ලබා ගැනීම සඳහා දැනට පවතින නීතිමය තත්ත්වය, එම ක්‍රියාවලියේ දී දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය, සහ පසුගිය වසර 5 තුළ මහා භාරකාර තැන වෙත එලෙස ලබා දී ඇති වන්දි ප්‍රමාණයන් හා විදේශ වන්දි ගෙවීමට අදාළ චක්‍රලේඛ පිළිබඳ වාර්තාවක් 2024 ජුනි මස 06 වන දිනට ප්‍රථමයෙන් කාරක සභාව වෙතලබාදෙන ලෙස විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිතව දන්වා සිටින ලෙසත්, උක්ත විෂය සම්බන්ධයෙන් 2024 ජුනි 20 දින පැවත්වීමට නියමිතමීළඟ කාරක සභා රැස්වීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ මහජන රාජ්‍ය තාන්ත්‍රික අංශය (Consular Affairs Division) කැඳවීමට කටයුතු කරන කාරක සභාවේ සභාපති ලෙසත් විසින් කාරක සභාවේ ලේකම් වෙතඋපදෙස් ලබාදෙන ලදී. | මේ පිළිබඳ වාර්තාවක් අංක PT/02/CA/01/740 හා 2025.03.27 දිනැති ලිපිය මගින් ඔබ වෙත යොමු කර ඇත.<br>විදේශ කටයුතු අංශයේ කොන්සියුලර් අංශය සමඟ 2025.06.11 දින හා 2026.02.19 දින වල විදේශ වන්දි ගෙවීම් කටයුතු කාර්යක්ෂමව කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | | |
|---|---|---|
| | විදේශගත වූ ශ්‍රී ලාංකිකයෙක්/ ශ්‍රමිකයෙක් මියගිය විටදී උරුමක්කරුවන් සඳහා වන්දි මුදල් හා හිඟ වැටුප් ලබා දීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සකස් කරන ලද සාරාංශයක් 2024.05.13 දින වන විට කාරක සභාව වෙත ලැබීමට සලස්වන ලෙස බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. | |
| 11 | <u>විහාර වන්දි ලබාදීම.</u><br><br>දිවයින පුරා පිහිටි විහාරස්ථාන 417 ක් සඳහා රු.මිලියන 1170ක වන්දි ප්‍රමාණයක් ගෙවීමට ඇති බැවින්, එලෙස වන්දි ලබාදීම සඳහා නියමිත විහාරස්ථාන වෙත යම් ආකෘති පත්‍රයක් සකස් කර යවා අවශ්‍ය තොරතුරු ලබාගෙන නඩු කටයුතු/ප්‍රශ්නගත කරුණු නොමැති විහාරස්ථාන සඳහා අදාළ මුදල් නිදහස් කිරීමට කටයුතු කර ඒ සම්බන්ධ ප්‍රගතිය 2024 ජූනි 20 දින වන විට කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලෙස කාරක සභාව බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර. ග.නි. / ග.නි. වෙත නිර්දේශ කළේය | මේ පිළිබඳ වාර්තාවක් අංක PT/02/CA/01/740 හා 2025.03.27 දිනැති ලිපිය මඟින් ඔබ වෙත යොමු කර ඇත. විහාර වන්දි ආඥා පනත යටතේ වන වන්දි ගෙවීම් අදාල විහාරස්ථානයේ නිශ්චිත සංවර්ධන කාර්යය සඳහා ගෙවීම් නිදහස් කරනු ලැබේ. මෙහිදී විහාරස්ථායේ අවශ්‍යතාවය අනුව එම කටයුතු සිදුවන බැවින් වන්දි හිමිකම් දැනුම් දීම හා අවශ්‍ය අවස්ථා වලදී හිමිකම් නිදහස් කිරීමේ කාර්යය සම්බන්ධයෙන් පමණක් මෙම දෙපාර්තමේන්තුවේ වගකීම පවතී. |
| 12 | <u>මහා භාරකාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි යාවත්කාලීන කිරීම.</u><br><br>මහා භාරකාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි, දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන්, අවශ්‍ය අයදුම්පත් හා දේපළ සම්බන්ධ තොරතුරු ඇතුළත් කර එහි දෙමළ පරිවර්තනයන් ද 2024 ජූනි මස 1 දිනට ප්‍රථමයෙන් ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙස බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කරන ලදී. | දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි දෙපාර්තමේන්තුව විසින් සලසන සේවාවන් හා එම සේවා කටයුතු ලබා ගැනීමට උපයෝගී කර ගන්නා අයදුම්පත් හා තොරතුරු 2024 ජූනි 01 දිනට පෙර ඇතුලත් කර ඇත. දෙමළ පරිවර්ථනයේද කොටස් වශයෙන් යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. මේ වන විට කාර්යසාධන වාර්තාවද භාෂාත්‍රයෙන්ම ඇතුලත් කර ඇත. |

| | | |
|---|---|---|
| 13 | <u>මහා භාරකාරවරයා සතු දේපළ රජයට පවරාගත් අවස්ථාවලදී වන්දි ලබාදීම.</u><br><br>වොස්වැගන් කර්මාන්තශාලාවට හා වයඹ විශ්ව විද්‍යාලයට මහා භාරකාරවරයා සතු දේපළ පවරාගත් බවත් ඒ සඳහා ලද රුපියල් මිලියන ගණනක වන්දි මුදල නඩු කටයුත්තක් හේතුවෙන් මේ වනතෙක් නිදහස් කර ගැනීමට නොහැකි වී ඇති බවත් එම මුදල් ලබා ගැනීමෙන් අනතුරුව අදාළ ඉඩම් පැවරුම්කරුවන්ගේ අරමුණු ඉෂ්ට කිරීම සඳහා යොදවන බවත් බුද්ධ ශාසන, ආගමික සංස්කෘතික හා අමාත්‍යාංශයේ කළේය. කටයුතු ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය. | කුලියාපිටිය දිසා අධිකරණයේ පවත්වාගෙන යන අංක 9/LA නඩුව මේ වන තෙක් අවසන් වී නොමැත. |

ප්‍රින්ස් සේනාධිර,

ලේකම්,

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

ප්‍රින්ස් සේනාධීර
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත
කොළඹ 07.

ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි (පා.ම.)
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
08 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

~~ආචාර්ය~~ හිනිදුම සුනිල් සෙනෙවි,

ගරු අමාත්‍ය,

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය